Australian Government
Department of Home Affairs

# ඔස්ට්‍රේලියාවට ඇතුළු වීම

ඔස්ට්‍රේලියාවට ඇතුළු වීමට පහත පියවර අනුගමනය කරන්න.

## 1 පියවර - ඔබ ඔබේ සංචාරය වෙන් කිරීමට පෙර

### ඔබේ වීසා අවශ්‍යතා පරීක්ෂා කරන්න

ඔස්ට්‍රේලියාවට වීසා නොමැතිව පැමිණීමට උත්සාහ නොකරන්න. ඔබට වීසා ක්‍රම බැලීමට අපගේ වීසා සෙවීම භාවිත කළ හැක.

## 2 පියවර - ඔබේ එන්නත්කරණ අවශ්‍යතා පරීක්ෂා කරන්න

ඔබේ එන්නත්කරණ තත්ත්වය ඔස්සේ ඔබට ඔස්ට්‍රේලියාවට පැමිණීමේදී සිදුකළ යුතු දේ දැකගත හැකිය.

මෙමගින් ඔබ ඔස්ට්‍රේලියාවේ ජාත්‍යන්තර සංචාර අරමුණු සඳහා එන්නත්කරණ අවශ්‍යතා සපුරා ඇත්දැයි බලන්න.

**පහත කරුණුවලට අදාළ නම් ඔස්ට්‍රේලියාවට පැමිණෙන වීසා හිමිකරුවන්ගේ වීසා අවලංගු වීම හෝ රඳවා ගැනීම සිදු විය හැක:**

- **ඔස්ට්‍රේලියාවේ දේශසීමා ප්‍රවේශ අවශ්‍යතාවලට අනුකූලව ජාත්‍යන්තර සංචාරක අරමුණු සඳහා සම්පූර්ණයෙන්ම එන්නත් නොකර ඇතිනම්; හෝ**
- **ඔස්ට්‍රේලියානු රජය විසින් නිර්වචනය කරන ලද පරිදි COVID-19 එන්නත සඳහා වෛද්‍ය ප්‍රතිවිරෝධතා නොමැති නම්; හෝ**
- ***නිදහස් කළ අංගයක* හෝ තනි සංචාරක නිදහස් කිරීමක් නොමැති නම්.**

ඔබ මෙම අවශ්‍යතා සපුරන්නේ නැති නම්, ඔබ එන්නත් නොකළ සංචාරකයින් සඳහා වන පියවර අනුගමනය කළ යුතුය.

## 3 පියවර - ඔබේ එන්නත්කරණ සහතිකය ලබාගැනීම

ඔබ ඕස්ට්‍රේලියාවේදී එන්නත් කර ඇති නම් ජාත්‍යන්තර COVID-19 එන්නත් සහතිකයක් (ICVC) ලබා ගන්න.

ඔබ විදේශයකදී එන්නත් කර ඇත්නම් සහ ICVC නොමැති නම්, ඔබ ඕස්ට්‍රේලියාවේ අවශ්‍යතා සපුරාලන විදේශීය එන්නත් සහතිකයක් ලබා ගත යුතුය.

වැඩිදුර තොරතුරු සඳහා එන්නත්කරණ හා පරීක්ෂණ අවශ්‍යතා බලන්න.

## 4 පියවර - ප්‍රාන්ත සහ දේශභූමිවල පැමිණීමේ අවශ්‍යතා පරීක්ෂා කරන්න

ඔබ ඔබගේ ගුවන් ගමන වෙන් කරවා ගැනීමට පෙර, ප්‍රාන්ත සහ දේශභූමි පැමිණීමේ අවශ්‍යතා පරීක්ෂා කරන්න. මෙයට දේශසීමා ඇතුළු වීමේ ලියාපදිංචි කිරීමේ පෝරම හෝ නිරෝධායන ඇතුළත් විය හැක.

ඔබ සංක්‍රමණය වන සහ ගමන් කරන සියලුම ප්‍රාන්ත සහ දේශභූමි පරීක්ෂා කරන්න. අවශ්‍යතා කෙටි දැනුම්දීමකින් වෙනස් විය හැක.

ඔබට අදාළ වන සංචාරක සීමා හා අවශ්‍යතාවලට අනුගත වීම ඔබේ වගකීමකි. ඔබ ඒවාට අනුගත නොවන්නේ නම්, ඔබට සිර දඬුවම් සහ සැලකිය යුතු දඩ මුදල් ඇතුළු බරපතල දඬුවම්වලට මුහුණ දීමට සිදුවිය හැක. ඒවා බලන්න: ප්‍රාන්ත සහ දේශභූමිවල ඇතුළු වීමේ අවශ්‍යතා.

## 5 පියවර - ඔබේ සංචාරය සැලසුම් කිරීම

### ඉදිරියට සැලසුම් කරන්න

ඔබේ ගමනේදී ප්‍රමාදය හෝ බාධාව ඇති වූ විට කුමක් සිදුකරන්නේද යන්න සලකා බැලිය යුතුය.

## 6 පියවර - ඔබේ සංචාරය වෙන් කරවා ගැනීම

## 7 පියවර - සංචාරයට සූදානම් වීම

## ඔබේ ඩිජිටල් මගී ප්‍රකාශය සම්පූර්ණ කරන්න

ඔබට ඔබේ ගුවන් ගමනට දින හතකට පෙර ඔබේ ඩිජිටල් මගී ප්‍රකාශය (DPD) ආරම්භ කළ හැකි අතර ඔබ ඕස්ට්‍රේලියාවට පිටත් වීමට පැය 72කට පෙර එය ඉදිරිපත් කළ හැක.

DPD තීරනාත්මක සෞඛ්‍ය තොරතුරු ඉල්ලා සිටී. මෙම තොරතුරු සැපයීම බලාත්මක කළ හැකි අවශ්‍යතාවයකි. එය ඔබට ගුවන් තොටුපළේදී හෝ ඔබ ඕස්ට්‍රේලියාවට පැමිණෙන විට අනවශ්‍ය ප්‍රමාද අත්විඳීමට සිදුනොවන බව සහතික කිරීමට උපකාරී වනු ඇත. වැඩිදුර තොරතුරු සඳහා බලන්න: DPD

## 8 පියවර - ගුවන් යානයට ගොඩ වීමට පෙර COVID-19 පරීක්ෂණයක් කර ගන්න

ඔබට මෑත කාලීන සෘණාත්මක COVID-19 පරීක්ෂණයක් පිළිබඳ ගුවන් කාර්ය මණ්ඩල සාක්ෂි පෙන්වීමට අවශ්‍ය වෙයි.

ඔබට අවශ්‍ය පරීක්ෂණය කුමක්ද සහ පරීක්ෂණය කළ යුත්තේ කවදාද යන්න පිළිබඳ වැඩි විස්තර සඳහා, එන්නත්කරණය හා පරීක්ෂාව බලන්න.

## 9 පියවර - ගුවන් තොටුපල සඳහා ඔබේ ලේඛණ සකසාගැනීම

ඔබ ගුවන්යානයට ඇතුළු වන විට, ගුවන් සේවකයෝ ඔබෙන් පහත ඒවා ඉල්ලා සිටිති:

- ගමන් බලපත්‍රය
- වීසා
- ඔබ ඕස්ට්‍රේලියාවේ ජාත්‍යන්තර සංචාර අරමුණු සඳහා එන්නත්කරණ අවශ්‍යතා සපුරා ඇති බවට සාධක
- සෘණාත්මක COVID-19 පරීක්ෂා ප්‍රතිඵලයක්
- සම්පූර්ණ කළ DPD.

## 10 පියවර - ඕස්ට්‍රේලියාවට ඇතුළු වීමේ අවශ්‍යතා සම්පූර්ණ කිරීම

මෙයට ආගමන, රේගු සහ ජෛව ආරක්ෂණ නිෂ්කාශනය ඇතුළත් වේ.

වැඩිදුර තොරතුරු සඳහා [දේශසීමා පසුකිරීම] බලන්න.

## 11 පියවර - ප්‍රාන්ත සහ දේශභූමිවල පැමිණීමේ අවශ්‍යතා සපුරාලීම

බොහෝ ප්‍රාන්ත සහ දේශභූමිවල ඔබ ඕස්ට්‍රේලියාවට පැමිණීමෙන් පසු ඉක්මනින් COVID-19 පරීක්ෂණයක් කිරීමට අවශ්‍ය වේ.

ඔබ මෙය හා [ඔබ සංචාරය කරනා සියලුම ප්‍රාන්ත හා ප්‍රදේශවල] අවශ්‍යතා ද පරීක්ෂා කළ යුතුය.

# ඕස්ට්‍රේලියාව හරහා සංක්‍රමණය වීම

## පැය 72 ක් හෝ ඊට අඩු සංක්‍රමණයක් සඳහා

ඔබ ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වන්නේ නම්, ඔබේ මූලික ප්‍රවේශයෙන් පැය 72 කට නොඅඩු ඕස්ට්‍රේලියාවෙන් පිටත් වන ගුවන් යානයක ඉදිරි ප්‍රවේශ පත්‍රයක් වෙන්කරවාගත **යුතුය.** සුදුසු සම්බන්ධිත ගුවන් යානයක් නොමැතිනම්, ඕස්ට්‍රේලියාව හරහා සංක්‍රමණය වීම සිදුකළ **නොහැකිවනු** ඇත.

### වීසා අවශ්‍යතා

ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වීමට ඔබ වලංගු වීසා බලපත්‍රයක් තිබීම හෝ [වීසා නොමැතිව සංක්‍රමණ වන] (TWOV) සුදුසුකම් ලත් රටක අයෙකු විය යුතුය.

ඔබට වලංගු වීසා බලපත්‍රයක් නොමැති නම් හෝ TWOV සඳහා සුදුසුකම් නොලබන්නේ නම් ඔබ ඕස්ට්‍රේලියාවට ඇතුළු වීමට වීසා බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කළ යුතුය. පැය 72ක් දක්වා ඕස්ට්‍රේලියාව හරහා සංක්‍රමණය වීමට [සංක්‍රමණ වීසා (උප පන්තිය 771)] සඳහා අයදුම් කරන්න.

### COVID-19 පරීක්ෂණය

ඔබට ඕස්ට්‍රේලියාව හරහා යාමට සෘණාත්මක COVID-19 පරීක්ෂණයක් අවශ්‍ය වේ. වැඩිදුර තොරතුරු සඳහා [එන්නත්කරණ හා පරීක්ෂණ] බලන්න.

## ඩිජිටල් මගී ප්රකාශය

ඔබට ඔබේ ගුවන් ගමනට දින හතකට පෙර ඔබේ ඩිජිටල් මගී ප්‍රකාශය (DPD) ආරම්භ කළ හැකි අතර ඔබ ඕස්ට්‍රේලියාවට පිටත් වීමට පැය 72කට පෙර එය ඉදිරිපත් කළ හැක.

DPD තීරනාත්මක සෞඛ්‍ය තොරතුරු ඉල්ලා සිටී. මෙම තොරතුරු සැපයීම බලාත්මක කළ හැකි අවශ්‍යතාවයකි. එය ඔබට ගුවන් තොටුපළේදී හෝ ඔබ ඕස්ට්‍රේලියාවට පැමිණෙන විට අනවශ්‍ය ප්‍රමාද අත්විඳීමට සිදුනොවන බව සහතික කිරීමට උපකාරී වනු ඇත. වැඩිදුර තොරතුරු සඳහා බලන්න: DPD

## ප්‍රාන්ත සහ දේශභූමිවල අවශ්‍යතා

ඔබ පැමිණෙන ප්‍රාන්තය හෝ දේශභූමිය සඳහා වන සංක්‍රමණ අවශ්‍යතා ඔබ අනුගමනය කළ යුතුය. ඔබ ඉදිරි ගුවන් ගමන සඳහා රැඳී සිටින අතරතුර, ඔබට හෝටල් නවාතැන් වල රැඳී සිටීමට අවශ්‍ය විය හැකි අතර, ඔබේ නවාතැන් සඳහා ගෙවීමට ඔබෙන් ඉල්ලා සිටිය හැක. වැඩිදුර තොරතුරු සඳහා ප්‍රාන්ත හා දේශභූමිවල ඇතුළු වීමේ අවශ්‍යතා බලන්න.

## පැය 72 කට වඩා

ඔබේ මීළඟ ගුවන්යානයට පෙර පැය 72 ක් ඕස්ට්‍රේලියාවේ සිටී නම්, ඔබ ඕස්ට්‍රේලියාව හරහා ගමන් කරන ලෙස **සලකනු නොලැබේ**.

ඔබ ඕස්ට්‍රේලියාව සඳහා COVID-19 එන්නත් සහ පරීක්ෂණ අවශ්‍යතා, වීසා, ආගමන, රේගු ජෛව ආරක්ෂණ නිෂ්කාශනය සහ අනිවාර්ය සෞඛ්‍ය ප්‍රකාශ ඇතුළු අනෙකුත් සියලුම ප්‍රවේශ අවශ්‍යතා සපුරාලිය යුතුය. වැඩිදුර තොරතුරු සඳහා දේශසීමා පසුකිරීම බලන්න.

ඔබට ප්‍රාන්ත හා දේශභූමිවල පැමිණීමේ අවශ්‍යතා ද සපුරාලීමට සිදු වේ.